ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
அனர்த்த முகாமைத்துவ நிலையம்
DISASTER MANAGEMENT CENTRE

විද්‍යා මාවත,
කොළඹ 07

வித்யா மாவத்தை
கொழும்பு 07

Vidya Mawatha,
Colombo 07

ඔබේ අංකය / உமது இல / Your No.

මගේ අංකය / எனது இல / My No. DMC/07/2024/14

දිනය / திகதி / Date 2024.03.19

**ප්‍රධාන කර්තෘ,**

**කළමනාකරු(ප්‍රවෘත්ති).**

**<u>මාධ්‍ය නිවේදනය</u>**

**<u>පවතින වියලි කාලගුණික තත්ත්වය හමුවේ කැලෑගිනි තැබීම පාලනය කිරීම සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම</u>**

පවතින වියලි කාලගුණික තත්ත්වය හමුවේ අද දින (19) වන විට කැලෑගිණි ගැනීම් 50 ක් පමණ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරියට වාර්තා වී ඇත. මෙම සිදුවීම් පරීක්ෂා කිරීමේ දී බොහෝ ගිණිගැනීම් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වූ ඒවා බව නිරීක්ෂණය වන අතර හේන් ගොවිතැන් සඳහා බිම් සකස් කිරීම, සත්ව පාලනය සඳහා වියලි තණ බිම් ගිණිතැබීම, සතුන් දඩයම් කිරීම සඳහා කැලෑ ප්‍රදේශ ගිණිතැබීම, වන්නාන්තර නැරඹීමට පැමිණෙන පිරිස් විසින් සිදුකරනු ලබන ගිනි තැබීම්, දුම් වැටි වියලි ප්‍රදේශවලට විසි කර දැමීම මෙන්ම මාර්ග දෙපස පවිත්‍ර කිරීම සඳහා සිදු කරනු ලබන ගිණි තැබීම් හෝ මිනිසුන් හිතාමතාම සිදු කරනු ලබන ගිණි තැබීම් නිසා මෙම ගිනි ඇති වී තිබෙන බව හඳුනාගෙන ඇත. එසේම පවතින වියලි කාලගුණික තත්ත්වය තවදුරටත් පැවතිය හැකි බව කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අනාවැකි ඉදිරිපත් කර ඇති බැවින් මෙම තත්වය තවදුරටත් වර්ධනය වීම පාලනය කළ යුතුව ඇත.

තවද කැලෑ ගිණි තැබීම් සම්බන්ධයෙන් නෛතිකව දඬුවමට ලක් කළ හැකි බවත් යම් රක්ෂිත ප්‍රදේශයක් තුළ ගිණි දැල්වීම හෝ ගිනි පැතිරීමට ක්‍රියා කරීම 2009 අංක 65 දරණ කැලෑ සංශෝධන පනත අනුව වරදකරුවකු වන බවත් එවැනි වරදකට වසර හතකට නොවැඩි කාලයක් බන්ධනාගාර ගත කිරීමටත් රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට ලක් කිරීමටත් හෝ මෙම දඬුවම් දෙකටම යටත් කිරීමටත් හැකි අතර වනාන්තරයට සිදු කරනු ලැබූ හානිය අයකර ගැනීමටත් පනත මගින් ප්‍රතිපාදන සළසා ඇත.

පවතින වියලි කාලගුණ තත්ත්වය මත වනාන්තර ගිනිගැනීම් තවදුරටත් වැඩිවිය හැකි බැවින් කැලෑගිනි වළක්වා ගැනීමට සහ ක්ෂණික ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින සම්බන්ධීකරණ යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව, අවදානම් ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීම, කැලෑ ගිණි තබන පුද්ගලයින් නීතියේ රැහැනට හසු කිරීම සඳහා මේ වන විටත් අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇත.

ඒසේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ඇතුලු පාර්ශවකාර ආයතන විසින් කැලෑගිණි හේතුවෙන් වනාන්තරවලට ඇති කරනු ලබන බලපෑම සහ මහජන දේපළ සඳහා සිදු විය හැකි විනාශය අවම කිරීම සඳහා නිරන්තරයෙන් කටයුතු කරනු ලැබේ. මේ සඳහා මහජන මුදල් විශාල වශයෙන් වැය කිරීමට සිදු වන අතර කැලෑ ගිණි හේතුවෙන් සිදු වන පාරිසරික බලපෑම ද ඉතා විශාල වේ. එබැවින් වනාන්තර ගිනි තැබීමෙන් වළකින ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටින අතර වනාන්තර ගිණි තබන පුද්ගලයින් නීතියේ රැහැනට හසුකරදීමට කටයුතු කරන මෙන් මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**මේජර් ජනෙරාල් උදය හේරත් (විශ්‍රාමික),**

ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එම්එම් එච්ඩීඑම්සී පීඑස්සී

අධ්‍යක්ෂ ජනරාල්.

*for safer communities and sustainable development*

දුරකථන / தொலைபேசி / Telephone 2136136

ෆැක්ස් (කාර්යාලය) / தொலைநகல் (அலுவலகம்) / Fax (Office) 2670079 2670025

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General 2670070 2136100

Web: www.dmc.gov.lk Email: info@dmc.gov.lk

හදිසි ඇමතුම් / அவசர நடவடிக்கை அழைப்பு / Emergency Operations Hotline : 2136222/2670002